## හෝමියෝපති වෛද්‍ය සභාව - 2012

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට හෝමියෝපති වෛද්‍ය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

1.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2010 වර්ෂයේ විගණන ගාස්තු වෙනුවෙන් වූ රු.5,616 ක ඌන ප්‍රතිපාදනය පෙර වර්ෂ ගැලපුම් ගිණුම හර කළ යුතු වුවත්, එය විගණන ගාස්තු සඳහා වෙන් කිරීමේ ගිණුමට හර කර තිබුණි.

(ආ) 2011 වර්ෂයට අදාළ විගණන ගාස්තු ප්‍රතිපාදනය රු.30,000 ක් වී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එය නිරවුල් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී පූර්ව කාලපරිච්ඡේද දෝෂ වෙනුවෙන් රු.54,022 ක වටිනාකමට ඇතුළත් කර ගැලපීම් කිරීම නිසා ඉහත හිඟහිටි විගණන ගාස්තුවද මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර තිබුණි.

(ඇ) වෛද්‍ය සභාවේ ස්ථිර සේවකයින් ලෙස වසර 5 කට අධික කාලයක සිට වෛද්‍යවරුන් හත් දෙනෙක් සහ ඖෂධ සංයෝජකවරුන් හත් දෙනෙක් සේවයේ නියුතුව සිටියද, ඔවුන් වෙනුවෙන් පාරිතෝෂික ප්‍රතිපාදන සලසා නොතිබුණි.

1.2.2 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව 2012 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළදී සභාවේ කටයුතුවල මෙහෙයුම් ප්‍රතිඵලය රු.29,305 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.74,938 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.104,243 ක මූල්‍ය ප්‍රතිඵලය පිරිහීමට සේවක වන්දි රු.181,688 ක් ගෙවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.2 ආයතනයට එරෙහිව ඇති නෛතික සිද්ධි

බාහිර ආයතන (කණ්ඩායම්) තුනක් විසින් වෛද්‍ය සභාව විසුරුවා හැරීම, සේවයෙන් පහ කිරීම හා සේවය අවසන් කිරීම නිසා එකතුව රු.3,200,000 ක වන්දි ඉල්ලා සභාවට එරෙහිව අධිකරණවල නඩු තුනක් ගොනුකර තිබුණි.

වෛද්‍ය සභාවේ සේවයේ නියුතුව සිටියදී විධිමත් පරිදි සේවය අවසන් නොකිරීම හේතුවෙන් හිටපු ලේඛකාධිකාරිවරයෙකු වෛද්‍ය සභාවට එරෙහිව නඩු පවරා තිබුණු අතර එම නඩු තීන්දුව අනුව එම තැනැත්තා වෙත රු.72,675 ක මුදලක් වන්දි ලෙස ගෙවීමට සිදුවී තිබුණ.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නීත්‍යානුකූල වෛද්‍ය සභාවක් නොතිබීම හේතුවෙන් 1970 අංක 7 දරන හෝමියෝපති පනතේ 22 වගන්තියේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීද නොහැකි වී තිබුණි.

(i). හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සඳහා අදාළ පර්යේෂණ හා අධ්‍යයන ධෛර්යමත් කිරීම

(ii). හෝමියෝපති ඖෂධ නිෂ්පාදනය, ආනයනය, විකිණීම හා බෙදාහැරීම සඳහා ව්‍යවස්ථා සම්පාදනය කිරීම

(iii). හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර 2009 වර්ෂයේදී ලී බඩු සම්පාදනය කරගෙන තිබුණද, වෛද්‍ය විද්‍යාලයේ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අදාළ නීතිමය රාමුව සකස් කර අදාළ කාර්යය ඉටු කිරීමේ කටයුතු සිදු කිරීමට විගණිත දිනය වූ 2013 මැයි 31 වන දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

1970 අංක 7 දරන හෝමියෝපති පනත අනුව පූර්ණ බලතල සහිත වෛද්‍ය සභාවක් පත් කරන තෙක් ඉහත සඳහන් කර ඇති කාර්යයන් ඉටුකර ගත නොහැකි බවද, නීත්‍යානුකූල සභාවක් පත් කිරීමට අවශ්‍ය කටයුතු දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් සිදු කරමින් පවතින බවද වෛද්‍ය සභාවේ සභාපතිවරයා විසින් අදහස් දක්වා තිබුණි. .

(ආ) ප්‍රදේශ හතක් තුළ පවත්වාගෙන යනු ලබන වෛද්‍ය සායන හතකින් තුනකම රෝගී සහභාගීත්වය පරකඩුව සායනයෙහි සියයට 11 කින්ද වේවැල්දෙණිය/ තෝලංගමුව සායනයෙහි සියයට 49 කින්ද, කුරුණෑගල සායනයෙහි සියයට 22 කින්ද අඩු වී තිබුණි.

(ඈ) **වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම**

(i). 2011 ජනවාරි 31 දින වන විට වෛද්‍ය සභාව විසුරුවා හැර තිබුණු අතර, වෛද්‍යවරුන් 191 ක් ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ලියාපදිංචියට අදාළ පනතේ වගන්තිය | විස්තරය | ලියාපදිංචි කර තිබූ වෛද්‍යවරු සංඛ්‍යාව 2011 | 2012 | 2012 දෙසැම්බර් 31 දිනට ඉන් මියගිය සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| I. | 27(1)(අ) | හෝමියෝපති වෛද්‍ය විද්‍යාව පිළිබඳ වසර 4 කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම | 54 | නැත | 04 |
| II. | 27(1)(ඇ) | වසර 10 කට නොඅඩු කාලයක් හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ නියැලී සිටින සභාව විසින් පිළිගත් වෛද්‍යවරුන් | 35 | නැත | 17 |
| III. | 27(2) | වසර 3 කට නොඅඩු කාලයක් වෛද්‍ය වෘත්තියේ නියැලී සිට ඇති හා සභාව විසින් පවත්වනු ලබන ලිඛිත විභාගයකට පෙනී සිට සුදුසුකම් ලැබූ වෛද්‍යවරුන් | 50 | නැත | 05 |
| IV. | 27(5) | තාවකාලික ලැයිස්තුවේ නම් ඇතුළත් වෛද්‍යවරුන්ට ලිඛිත විභාගයකින් පසුව ස්ථිර ලියාපදිංචිය ලබාදීම | 52 | නැත | 07 |
| | | එකතුව | 191 | | 36 |

(ii). වෛද්‍යවරු ලියාපදිංචි කිරීම සඳහා හෝමියෝපති වෛද්‍යවරු දැනුවත් කිරීම සඳහා 2012 සැප්තැම්බර් මාසයේදී රු.18,144 ක් වැයකර පුවත්පත් දැන්වීමක් පලකර තිබුණි. ඒ අනුව 2012 වර්ෂයේදී ලියාපදිංචිය සඳහා වෛද්‍යවරු හය දෙනෙකු ඉල්ලුම් කර තිබුණි. වෛද්‍ය සභාවක් නොතිබීම හේතුවෙන් ලියාපදිංචිය සිදු කිරීමට නොහැකි වී තිබුණි. ඒ අනුව පුවත්පත් දැන්වීම පල කිරීමේ වියදම නිෂ්ඵල වී තිබුණි.

(iii). මේ අනුව වර්ෂයෙන් වර්ෂය ලියාපදිංචි වෛද්‍යවරුන් සංඛ්‍යාව අඩුවෙමින් යන ප්‍රවණතාවයක් දක්නට ලැබෙන අතර මේ පිළිබඳ කඩිනම් අවධානය යොමු කර පිරිහීමේ තත්ත්වය මගහරවා ගැනීම සඳහා අවධානය යොමු විය යුතුවේ.

(ඈ) 2013 ජනවාරි 31 දින වනවිට වෛද්‍ය සභාව විසුරුවා හැර වසර දෙකක් ගතවී තිබුණු නමුත්, නව වෛද්‍ය සභාවක් පත්කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග 2013 මැයි 31 දින වනවිටත් ගෙන නොතිබුණි.

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

2012 ජනවාරි 05 දිනැති අතුරු කමිටු රැස්වීමේදී වෛද්‍ය සායන හතක් සඳහා පොදු නියෝග මාලාවක් සැකසීමට තීරණය කර තිබුණද, විගණිත දිනය වු 2013 මැයි 31 දින වනවිටත් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

2013 වර්ෂයේදී මෙය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව සභාවේ සභාපති විසින් පිළිතුරු දී තිබුණි.

3.3 <u>ද්‍රාෂ්‍ය අක්‍රමිකතා</u>

2010 වර්ෂයේදී වෛද්‍ය සභාව වෙත ලැබී තිබුණු රු.7,100 ක ලැබීමක් මුදල් පොතේ සටහන් කළද එය බැංකුගත කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් දිගින් උගටම බැංකු සැසඳුම් ප්‍රකාශනයෙහි හඳුනා නොගත් වටිනාකමක් ලෙස දක්වා තිබුණි. මෙම හඳුනා නොගත් ශේෂය 2012 දෙසැම්බර් මාසයේදී නැවත මුදල් පොතට බැර කර පෙර වර්ෂයේ ගැලපුම් ගිණුමට හර කිරීමෙන් බැංකු සැසඳුමින් හා මුල්‍ය ප්‍රකාශනයෙන් ඉවත් කර තිබුණි. වෛද්‍ය සභාව වෙත ලැබී තිබුණු මෙම රු.7,100 ක මුදල බැංකුගත නොවීමට හේතුව විගණනයට අනාවරණය නොවීය.

3.4 <u>නිෂ්කාර්ය වත්කම්</u>

හොමියෝපති වෛද්‍ය විද්‍යාලය වෙනුවෙන් 2009 වර්ෂයේදී මිලදීගත් රු.1,199,254 ක් වටිනා ස්ථාවර වත්කම් විගණිත දිනය වු 2013 මැයි 31 වන දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

3.5 <u>ආර්ථික නොවු ගනුදෙනු</u>

නියමිත දිනයන්හි මුදල් නොගෙවීම හේතුවෙන්, සේවක අර්ථසාධක අරමුදල සඳහා රු.5,880 ක්ද, සේවක භාරකාර අරමුදල සඳහා රු.4,098 ක්ද වශයෙන් එකතුව රු.9,978 ක මුදලක් අධිභාර වශයෙන් ගෙවීමට සිදු වී තබුණි.

## 3.6 කාර්ය මණ්ඩල පරිපාලනය

2012 දෙසැම්බර් 31 දිනට සභාවේ කාර්ය මණ්ඩලයේ පහත සඳහන් පරිදි තිදෙනෙකුගේ පුරප්පාඩු පැවතුණද, 2013 වර්ෂයේදී අදාළ බඳවා ගැනීම් සිදුකර ඇති බව සභාපතිවරයා දන්වා තිබුණි.

| තනතුර | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ලේඛකාධිකාරී | 01 | 01 | - |
| හෝමියෝපති වෛද්‍ය වෘත්තික | 07 | 07 | - |
| කළමනාකරණ සහකාර | 02 | 01 | 01 |
| ඖෂධ සංයෝජක | 07 | 07 | - |
| කාර්යාල සහායක | 02 | - | 02 |
| | 19 | 16 | 03 |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාරව 2012-2016 වර්ෂවලට අදාළ සංයුක්ත සැලැස්ම සකස් කර තිබුණද, එය වෛද්‍ය සභාවේ (අතුරු පාලක කමිටුවේ) අනුමැතිය ලබාගෙන ආයතන වෙත යොමු කර නොතිබුණි.

### 4.2 ක්‍රියාකාරී සැලැස්ම

2012 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද, ඒ සඳහා අතුරු පාලක කමිටුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර වෛද්‍ය සභාවක් නොතිබීම හේතුවෙන් සැලසුම්වල සඳහන් ඉලක්කයන් සපුරා ගැනීමට නොහැකි වී තිබුණි.

### 4.3 අයවැය පාලනය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.4 ඡේදය ප්‍රකාරව 2012 වර්ෂය සඳහා වෛද්‍ය සභාව වෙනුවෙන් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

### 4.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 4.5 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග ඉටු නොකිරීම

2010 සැප්තැම්බර් 15 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාකච්ඡා සටහන ප්‍රකාරව වර්තමාන තත්ත්වයට ගැලපෙන පරිදි සභාවේ රෙගුලාසි යාවත්කාලීන කළයුතු බවට නියෝග කර තිබුණද, වර්තමානයේදීද වෛද්‍ය සභාවක් පත්කර නොතිබීම හේතුවෙන් 2013 මැයි 31 දින වන විටත් එම රෙගුලාසි යාවත්කාලීන කර නොතිබුණි.

4.6 **<u>නව පනත සම්මත කරගැනීමේ ප්‍රමාදය</u>**

2005 අගෝස්තු මාසයේදී නව හෝමියෝපති පනත හඳුන්වා දීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබණි. කෙටුම්පත් පනත සඳහා නීතිපතිවරයාගේ අනුමැතිය 2011 ජූනි මාසයේදී ලබාගැනීමෙන් පසු අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි. විවිධ අවස්ථාවලදී අමාත්‍ය මණ්ඩලයේ හා එහි අනුකාරක සභාවේ නිර්දේශයන්ට අනුව පනත් කෙටුම්පත සංශෝධනය කෙරෙමින් පැවතුණද, එම කටයුතු 2013 මැයි 31 දින වන විටත් නිමකර නොතිබුණි.

5. **<u>පද්ධති හා පාලන</u>**

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) මුදල් පාලනය

(ආ) ලැබීම් පාලනය